ලැජ්ජා බිය ඊමාන් හෙවත් දේව විශ්වාසය අතරින් වූවකි

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී:
මිනිසෙක් තම සහෝදරයාට ලැජ්ජාව සම්බන්ධයෙන් උපදෙස් දෙමින් සිටිය දී ඔහුට සවන්
දුන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ: "ලැජ්ජා බිය ඊමාන්
හෙවත් දේව විශ්වාසය අතරින් වූවකි." [صحيح] [متفق عليه]

මිනිසෙක් තම සොහොයුරාට ඕනෑවට වඩා ලැජ්ජාශීලී වීම අත්හැර දමන මෙන් අවවාද කරන අයුරු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට ඇසුණි. එවිට එතුමාණෝ ඔහුට: සැබැවින්ම ලැජ්ජාව යනු විශ්වාසයේ කොටසක් බවත් එය යහපත හැර වෙනත් කිසිවක් රැගෙන නො එන බවත් පැහැදිලි කළහ. ලැජ්ජාව යනු අලංකාර ක්රියාවන් මත රැඳෙන, අශීලාචාර දෑ මඟ හරවන ගුණාංගයකි.

https://sunnah.global/hadeeth/si/show/5478